# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 2106/4 – 2019 ජනවාරි 14 වැනි සඳුදා – 2019.01.14**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2019 අංක 05 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/2/2016/සීර්බී/21.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: 4/2/1/85.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියෙකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

2019 ජනවාරි මස 03 වැනි දින.
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'', අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි.**– ප්‍රාදේශීය ලේකම්, දොම්පෙ.

2. **ඉඩමේ විස්තරය.**– බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දොම්පෙ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගඟබඩපත්තුව සුළු කොට්ඨාසයේ, අංක 392ඒ, වෙරළුගම්පල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ වෙරළුගම්පල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ගම් 4063 හා 2017.12.20 දිනැති මූලික පිඹුරෙහි පහත සඳහන් ඉඩම් කොටස්වලට මායිම්:

01. **කැබලි අංක 01 – පුංචි නැඳුන්ගොල්ල – ප්‍රමාණය: හෙක්. 2.4458**

උතුරට: මාර්ගය (ප්‍රා.ස.) සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි අනුමැතිය වෙල්යාය; නැගෙනහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි අනුමැතිය වෙල්යාය, කැබලි අංක 2 සහ පද්මිනී ලොකු බාලසූරිය හිමිකම් කියන පුංචි නැඳුන්ගොල්ල; දකුණට: කැබලි අංක 2, පද්මිනී ලොකු බාලසූරිය හිමිකම් කියන පුංචි නැඳුන්ගොල්ල සහ කුමාරපේලි ආරච්චිගේ ආරියදාස හිමිකම් කියන පුංචි නැඳුන්ගොල්ල; බටහිරට: කුමාරපේලි ආරච්චිගේ ආරියදාස හිමිකම් කියන පුංචි නැඳුන්ගොල්ල සහ මාර්ගය (ප්‍රා.ස.).




*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

02. **කැබලි අංක 02 – පුංචි නැදුන්ගොල්ල – ප්‍රමාණය: හෙක්. 4.1225**
උතුරට: කැබලි අංක 1 සහ හිමිකම් කියන අය සොයාගත නොහැකි අනුමැතිය වෙල්යාය; නැගෙනහිරට: හිමිකම් කියන අය සොයාගත නොහැකි අනුමැතිය වෙල්යාය සහ පද්මී ලොකු බාලසූරිය හිමිකම් කියන පුංචි නැදුන්ගොල්ල; දකුණට: පද්මිනී ලොකු බාලසූරිය හිමිකම් කියන පුංචි නැදුන්ගොල්ල; බටහිරට: පද්මිනී ලොකු බාලසූරිය හිමිකම් කියන පුංචි නැදුන්ගොල්ල සහ කැබලි අංක 1.

02 - 22

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.